# පාසල් පිළිබඳ අන්තර්ජාලය මගින් (Web Based) තොරතුරු ලබාගැනීමේ පහසුකම් දියුණු කිරීමේ සංකල්ප පත්‍රිකාව

## තාර්කිතය (RATIONAL)

පාසල් අධීක්ෂණය, පාසල් පරීක්ෂා කිරීම, පාසල් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාගැනීම යනාදිය සඳහා විවිධ පාර්ශව විසින් නිතර තොරතුරු විමසීම සිදු කරනු ලැබේ.

එය නිලධාරින්ගේ සාමාන්‍ය රාජකාරි වලට බාධාකාරි වන අතර, නියමිත දිනට නිවැරදි තොරතුරු ලබා නොදීම මත තොරතුරු ලබාගන්නා පාර්ශවයද අපහසුවට පත්වේ.

මෙවැනි විවිධ අවස්ථා වලදී සිදුවන ව්‍යාකූලතා, අපහසුතා. ප්‍රමාදවීම් යාවත්කාලීන නොවූ වැරදි තොරතුරු ලබාදීම් නිසා සිදුවන මුදල්, කාලය , අවස්ථා නාස්තිවීම වළක්වා ලීම මගින් සේවාලාභීන්ට කාර්යක්ෂම සේවා එලදායීව සැපයීම පිණිස මෙම ක්‍රමවේදය යෝජනා කරනු ලැබේ.

එමගින් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසින් කොට්ඨාස මට්ටමින්, අප විසින් ලබා දෙන ආකෘතියක් පරිදි පාසලේ අත්‍යවශ්‍ය තොරතුරු සකස්කරනු ලබන අතර එම තොරතුරු සරල ආකෘතියක් මත මුද්‍රිතව හා අන්තර්ජාල (WEB) මාධ්‍ය මගින් තොරතුරු අවශ්‍ය අය වෙත ලබාගැනීම සඳහා මඟපෙන්වීම් කරනු ලැබේ.

ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශ, ජාතික අධයාපන ආයතනය, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වැනි ඕනෑම ආයතනයකටත් බාහිර ආයතන, දේශපාලන අධිකාරිය හා විගණන වැනි අංශ වලටත් යම් පාසලක් පිළිබඳ අවශ්‍ය සංස්කරණය කරන ලද යාවත්කාලීන වූ තොරතුරු ඕනෑම මොහොතක ලබාගැනීමේ හැකියාව ඇත.

එමගින් විදුහල්පති ඇමතීම, පාසලට දුර හා මාර්ගය හඳුනාගැනීම, පාසලේ පවතිනපන්ති, ශිෂ්‍ය, ගුරු සංඛ්‍යාව වැනි තොරතුරු ලබාගැනීම වැනි සරල හා අත්‍යවශ්‍ය තොරතුරු ලබාගෙන සෘජුව පාසලට උපකාර කිරීම හෝ වෙනත් රාජකාරි අවශ්‍යතා ඉටුකර ගැනීමට පහසුව සැලසේ.

.

# අරමුණු

I. පාසලක් හඳුනාගැනීමට අත්‍යාවශ්‍ය තොරතුරු අධ්‍යාපන පද්ධතිය හා ප්‍රජාව වෙත අවශ්‍ය අවස්ථා වලදී ඍජුව, නිවැරදිව හා කඩිනමින් ලබාදීම පිණිස පහසුකම් සැලසීම.

II. ඒ මඟින් විවිධ ආයතන ඉල්ලුම් කරන තොරතුරු යාවත්කාලීනව හා ක්ෂණිකව සැපයීම මඟින් අනවශ්‍ය වලන හා ව්‍යාකූලතා වැළැක්වීම.

III. මුද්‍රිතව හා වෙබ් අඩවි මඟින් තොරතුරු ලබාදීම *(Web අඩවිය මාසිකව යාවත්කාලීන වේ)*

IV. පාසල පිළිබඳ අත්‍යාවශ්‍ය මූලික තොරතුරු ඊට ඇතුළත් කිරීම හා අවශ්‍ය විට සංස්කරණය.

# ක්‍රමවේදය

I. අත්‍යවශ්‍ය තොරතුරු ආකෘතියක් සැකසීම *(2019)*

II. එම ආකෘතිය පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු මඟින් තොරතුරු රැස්කිරීම හා කොට්ඨාස මට්ටමින් මුද්‍රිත තොරතුරු ගොනුවක් සැකසීම *( 2019)*

III. එය අදාළ ආයතන වෙත ලබාදීම *(2019)*

IV. වෙබ් පිටුව සැකසීම හා යාවත්කාලීන කිරීම *(2020)*

V. වෙබ් පිටුව මඟින් තොරතුරු ලබාදීම *(2020 – 2021)*

VI. මාසිකව කොට්ඨාස අධ්‍යාපන සංසද වලදී යාවත්කාලීන කිරීම

# ලබා ඇති ප්‍රගතිය

I. මුද්‍රිත තොරතුරු ගොනුව නිසි ලෙස නිම කර 2019 වසරේ සකස් කර ඇත.

II. Web අඩවිය 2021 වසර දක්වාම යාවත්කාලීන කරඇත.

III. තොරතුරු සැපයීමේදී පවතින ගැටලු අවම වී ඇත.

IV. පාසල් සොයා ගැනීම, හඳුනාගැනීම, තොරතුරු සපයා ගැනීම අදාළ පාර්ශව විසින්ම මෙම පද්ධතිය භාවිතා කර සිදු කර ගනු ලැබේ.